# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## දෙවන වාර පරීක්ෂණය - 2016
## 13 ශ්‍රේණිය
# ලංකා ඉතිහාසය
## II - පත්‍රය

නම :- ................................................................ අංකය :- ........................... පන්තිය :- ...........

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
- ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථානයන් ලකුණු කොට නම් කරන්න. ඉන් කැමති දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

01. 1. පරාක්‍රම සමුද්‍රය 2. කුරුණෑගල 3. ගෝකණ්ණ
4. මඩකලපුව 5. අනුරාධ ග්‍රාම 6. ඉරමඩු වැව
7. පුලස්තිපුර 8. මාතලේ

02. 1. වට්ටගාමිණී අභය රජුට මුහුණදීමට සිදුවූ අභියෝග කවරේද ?
2. ඔහු මෙම අභියෝග ජයගත් අයුරු පැහැදිලි කරන්න.

03. විජයබා රජු පොළොන්නරුවේ සිටි ශ්‍රේෂ්ඨ රජ කෙනෙකි. පහත දැක්වෙන මාතෘකා ඇසුරෙන් මෙය පැහැදිලි කරන්න.
1. විදේශ ආධිපත්‍යයෙන් රට මුදා ගැනීම හා රට එක්සත් කිරීම.
2. ඔහුගේ ශාසනික කටයුතු

04. උඩරට රාජධානිය බිඳ වැටීමට තුඩුදුන් සාධක විචාරාත්මක විමසන්න.

05. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පැහැදිලි කරන්න.

1. කෝට්ටේ යුගයේ සාහිත්‍ය 2. දඹදෙණි යුගයේ සාහිත්‍ය

3. අමද්‍යප ව්‍යාපාරය 4. 19 ආගමික පුනර්ජීවනය

06. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසින් හා ලන්දේසීන් විසින් අනුගමනය කළ ආගමික හා ආර්ථික ප්‍රතිපත්ති පැහැදිලි කරන්න.

07. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය පැහැදිලි කරන්න.

ඩී.එස්. සේනානායක විද්‍යාලය කොළඹ 07.

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.

## දෙවන වාර පරීක්ෂණය - 2016

### 13 ශ්‍රේණිය

## ලංකා ඉතිහාසය

### I - පත්‍රය

I කොටස

අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නො ගැළපේ. එම නො ගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.

1. 1. මහාතිත්ථ 2. ගෝකණ්ණ 3. සූකරතිත්ථ
 4. කාලතිත්ථ 5. කච්ඡකතිත්ථ (.........)

2. 1. ථූපාරාමය 2. මහා සෑය 3. දක්ඛින ථූපය
 4. කොට වෙහෙර 5. ලංකාරාමය (.........)

3. 1. ගල්පොත ලිපිය 2. හැටදාගෙය ලිපිය 3. දඹුල්ල ලිපිය
 4. කටුගහගල්ලේ ලිපිය 5. හෝපිටිගමු ලිපිය (.........)

4. 1. 1562 මුල්ලේරියාව සටන 2. 1954 දන්තුරේ සටන
 3. 1602 බලන සටන 4. 1630 රන්දෙණිගල සටන
 5. 1638 ගන්නොරුව සටන (.........)

5. 1. බ්‍රවුන්රිග් 2. ටොරිංටන් 3. ග්‍රෙගරි
 4. වෙස්ට් රිජ්වේ 5. අංගල්බෙක් (.........)

අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නො ගැළපේ. එම නො ගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

6. 1. මෙකවරණ අභය - ගෝඨාභය රජු
 2. උතර මහරජ - වසභ රජු
 3. සරතරය - තිරිතර රජු
 4. මපුරුම් බුදදස් ළපරිදෙව - බුද්දක පාරින්ද රජු
 5. මහරජ ගාමිණි අභය - ගජබාහු රජු (.........)

7. 1. පදින්නෝරු වාපි - පදවිය වැව
 2. මණිහිරි වාපි - මින්නේරිය වැව
 3. මණ්ඩවාටක වාපි - කණ්ඩලම වැව
 4. පත්තපාෂාණ වාපි - නාච්චදූව වැව
 5. මහදාරගල්ල වාපි - මහගල්කඩවල වැව (.........)

8. 1. කුසුමාසන දේවි - දෝන කතරිනා කුමරිය
 2. පළමුවන රාජසිංහ රජු - ටිකිරි බණ්ඩාර කුමාරයා
 3. අටවන වීර පරාක්‍රමබාහු රජු - අම්බුලුගල කුමාරයා
 4. දෙවන විමලධර්මසූරිය රජු - ඕස්ට්‍රියාවේ දොන් ජුවන් කුමාරයා
 5. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු - කන්නසාමි කුමාරයා (.........)

9. 1. ස්පිල්බර්ජන් - පළමුවන විමලධර්මසූරිය රජු
 2. වෙස්ටර්වෝල්ඩ් - දෙවන රාජසිංහ රජු
 3. ජෝන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු
 4. හියු බොයිඩ් - රාජාධිරාජසිංහ රජු
 5. රොබර්ට් ඇන්ඩෘස් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (.........)

10. 1. පරමධම්ම චේතිය පිරිවෙන - රත්මලානේ ධම්මාරාම හිමි
2. පානදුරාවාදය - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
3. සහිරා විදුහල - සිද්දි ලෙබ්බෙතුමා
4. විද්‍යෝදය පිරිවෙන - හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
5. ශෛව ප්‍රගාස සභා - අරුමුග නාවලර්තුමා (.........)

අංක 11 සිට 15 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම / ප්‍රකාශය / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න.

11.

| | X | | Y |
|---|---|---|---|
| i. | දුට්ඨගාමණී රජු | A | කපිසීය |
| ii. | වට්ඨගාමණී රජු | B | පුස්සදේව |
| iii. | ධාතුසේන රජු | C | කිත්නුවරගල් |
| iv. | පළමුවන විජයබාහු | D | රජු මිගාර |
| v. | පළමුවන පරාක්‍රමබාහු රජු | E | චල |

1. BDECA 2. BEDCA 3. BADEC
4. BDCEA 5. BAEDC (.........)

12.

| | X | | Y |
|---|---|---|---|
| i. | මුන්නේශ්වරම් කෝවිල | A | කතරගම |
| ii. | තිරුකේතීශ්වරම් කෝවිල | B | හලාවත |
| iii. | තිරුකෝනේශ්වරම් කෝවිල | C | පොළොන්නරුව |
| iv. | ගනේෂ කෝවිල | D | ත්‍රිකුණාමලය |
| v. | ස්කන්ධකුමාර කෝවිල | E | මාතොට |

1. BDECA 2. BEDCA 3. BADEC
4. BDCEA 5. BAEDC (.........)

13.

| | X | | Y |
|---|---|---|---|
| i. | පළමුවන රාජරාජ | A | කාලිංග |
| ii. | වෙං - හෝ | B | ජාවක |
| iii. | මාඝ | C | චෝළ |
| iv. | චන්ද්‍රභානු | D | චීන |
| v. | මාරවර්මන් | E | පාණ්ඩ්‍ය |

1. BDECA 2. EBDCA 3. ABDEC
4. DBCEA 5. CDABE (.........)

14.

| | X | | Y |
|---|---|---|---|
| i. | විලියම් ගොපල්ලව | A | පළමුවන විපක්ෂනායක |
| ii. | හෙන්රි මන්ක් මේසන් මුවර් | B | පළමුවන සභානායක |
| iii. | එන්. එම්. පෙරේරා | C | පළමුවන අග්‍රාණ්ඩුකාරවරයා |
| iv. | ඩී. බී. ජයතිලක | D | පළමුවන කථානායක |
| v. | ප්‍රැන්සිස් මොළමුරේ | E | පළමුවන ජනාධිපති |

1. BDACE 2. BEDCA 3. ADECB
4. ECABD 5. CAEDB (.........)

15.

| | X | | Y |
|---|---|---|---|
| i. | කෝල්බෘක් - කැමරන් කොමිසම | A | සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම |
| ii. | මෝර්ගන් කොමිසම | B | කැබිනට් ආණ්ඩුක්‍රමය හඳුන්වාදීම |
| iii. | රිඩ්ල් කොමිසම | C | විශ්ව විද්‍යාල පිහිටුවීමට යෝජනා කිරීම |
| iv. | ඩොනමෝර් කොමිසම | D | ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙමාර්තමේන්තුව පිහිටුවීම |
| v. | සොල්බරි කොමිසම | E | රාජකාරි ක්‍රමය අහෝසි කිරීම |

1. BCAED 2. CEDBA 3. EDCAB
4. ABEDC 5. BAEDC (.........)

අංක 16 සිට 20 තෙක් වූ ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

16. පහත දැක්වෙන ගොඩනැගිලි ඉදි කරවූ කාලය අනුව ඒවායෙහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන ලැයිස්තුව කුමක්ද ?
1. බැරැණ්ඩි කෝවිල, සත්මහල් ප්‍රාසාදය, දෙගල්දොරුව විහාරය, ගඩලාදෙණි විහාරය, ලෝවාමහාප්‍රාසාදය
2. ලෝවාමහාප්‍රාසාදය, සත්මහල් ප්‍රාසාදය, දෙගල්දොරුව විහාරය, ගඩලාදෙණි විහාරය, බැරැණ්ඩි කෝවිල
3. සත්මහල් ප්‍රාසාදය, ලෝවාමහාප්‍රාසාදය, දෙගල්දොරුව විහාරය, ගඩලාදෙණි විහාරය, බැරැණ්ඩි කෝවිල
4. ලෝවාමහාප්‍රාසාදය, සත්මහල් ප්‍රාසාදය, ගඩලාදෙණි විහාරය, බැරැණ්ඩි කෝවිල, දෙගල්දොරුව විහාරය
5. සත්මහල් ප්‍රාසාදය, ගඩලාදෙණි විහාරය, ලෝවාමහාප්‍රාසාදය, දෙගල්දොරුව විහාරය, බැරැණ්ඩි කෝවිල (.........)

17. රුහුණේ මුල් පාලකයන් ගැන වංසකථාවල සඳහන් වන අනුපිළිවෙළ දැක්වෙන්නේ මේවායින් කුමන ලැයිස්තුවේද ?
1. මහානාග, යටාලතිස්ස, ගෝඨාභය, කාවන්තිස්ස, දුටුගැමුණු
2. ගෝඨාභය, මහානාග, යටාලතිස්ස, කාවන්තිස්ස, දුටුගැමුණු
3. මහානාග, ගෝඨාභය, යටාලතිස්ස, කාවන්තිස්ස, දුටුගැමුණු
4. මහානාග, ගෝඨාභය, කාවන්තිස්ස, දුටුගැමුණු, යටාලතිස්ස
5. ගෝඨාභය, මහානාග, කාවන්තිස්ස, දුටුගැමුණු, යටාලතිස්ස (.........)

18. රාජ්‍ය පාලන මධ්‍යස්ථානය විතැන්වීමේ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන්නේ මින් කුමන ලැයිස්තුවේද ?
1. දඹදෙණිය, ගම්පොළ, කුරුණෑගල, යාපහුව, කෝට්ටේ
2. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ
3. දඹදෙණිය, කුරුණෑගල, ,ගම්පොළ, යාපහුව, කෝට්ටේ
4. යාපහුව , දඹදෙණිය, ගම්පොළ, කුරුණෑගල, කෝට්ටේ
5. කුරුණෑගල, දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කෝට්ටේ (.........)

19. ශ්‍රී ලංකා අණ්ඩුක්‍රම විකාශයෙහි ප්‍රධාන අවස්ථා අනුපිළිවෙලින් දැක්වෙන ලැයිස්තුව මින් කුමක්ද ?
1. කෝල්බෘක් - කැමරන් , ඩොනමෝර්, මැනිං - ඩෙවොන්ෂයර් , කෲමැකලම්, සොල්බරි
2. කෝල්බෘක් - කැමරන් , කෲමැකලම්, ඩොනමෝර්, මැනිං - ඩෙවොන්ෂයර්, සොල්බරි
3. කෝල්බෘක් - කැමරන් , මැනිං - ඩෙවොන්ෂයර්, කෲමැකලම්, ඩොනමෝර්, සොල්බරි
4. කෝල්බෘක් - කැමරන් , මැනිං - ඩෙවොන්ෂයර්, ඩොනමෝර්, කෲමැකලම්, සොල්බරි
5. කෝල්බෘක් - කැමරන් , කෲමැකලම් , මැනිං - ඩෙවොන්ෂයර්, ඩොනමෝර්, සොල්බරි (.........)

20. නිදහස් ශ්‍රී ලංකාවේ අගමැතිවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන්නේ මින් කුමන ලැයිස්තුවේද ?
1. ඩී. එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, ඩබ්ලිව් දහනායක.
2. ඩී. එස්. සේනානායක, ජෝන් කොතලාවල, ඩඩ්ලි සේනානායක, ඩබ්ලිව් දහනායක. එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක,
3. ඩඩ්ලි සේනානායක ., ඩී. එස්. සේනානායක, ජෝන් කොතලාවල, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, ඩබ්ලිව් දහනායක.
4. ඩී. එස්. සේනානායක, ඩබ්ලිව් දහනායක, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, ජෝන් කොතලාවල, ඩඩ්ලි සේනානායක
5. ජෝන් කොතලාවල, ඩී. එස්. සේනානායක, ඩබ්ලිව් දහනායක, ඩඩ්ලි සේනානායක , එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක. (.........)

අංක 21 සිට 25 තෙක් සෑමප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ. එය තෝරා ඊට අදාළ අංක තිත් ඉර මත ලියන්න.

21. අනුරාධපුර රාජධානි අවධියේ පරිපාලන සංවිධානය,
1. රාජාණ්ඩු ක්‍රමයක් පැවතීම.
2. පෙර සිරිතට අනුව පාලනය කිරීමට රජු බැඳී සිටීම.
3. රජු හා භික්ෂූන් වහන්සේ අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පැවතීම.
4. පාලන තන්ත්‍රය තුළ දමිළ අධිකාරී බලවත් ම නිලධාරියකු වීම.
5. විධිමත් ග්‍රාමීය හා ප්‍රාදේශීය පාලන ක්‍රමයක් පැවතීම. (.........)

22. පොළොන්නරු යුගයේ සංස්කෘතිය,
1. ගොඩනැගිලි ඉදිකිරීමේදී ගඩොල් භාවිතය බහුල වීම.
2. මෙරට සංස්කෘතියට හින්දු ආභාසය බෙහෙවින් ලැබීම.
3. පන්සියපනස් ජාතක කථා පොත රචනා කිරීම.
4. මූර්ති කලා නිර්මාණ අතර ගල් විහාර ප්‍රතිමා ප්‍රධාන තැනක් ගැනීම.
5. මෙම යුගයට ආවේණික විශේෂ ලක්ෂණ සහිත ගල් කණු නිශ්ශංක ලතා මණ්ඩපයෙහි දක්නට ලැබීම. (.........)

23. යාපන රාජධානිය,

1. මෙම රාජධානියේ ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධානතම මූලාශ්‍රය යාල්පාන වෛපවමාලෙ නමැති ග්‍රන්ථයයි.
2. රාජධානියේ අගනුවර වූයේ නල්ලූර් ය.
3. යාපනයේ ආර්යචක්‍රවර්ති රජවරු වන්නියාර්වරුන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වූහ.
4. 1619 දී පෘතුගීසීන්ට යටත්වීමත් සමඟ යාපන රාජධානිය අවසන් විය.
5. යාපන රාජධානියේ අවසන් රජු වූයේ පුවිරාජ පණ්ඩාරම් ය. (.........)

24. පෘතුගීසීන් හා ලන්දේසීන් සමඟ මහනුවර රාජධානිය පැවැත් වූ සම්බන්ධතා,

1. 1594 දී පෘතුගීසි හමුදා මෙහෙයවමින් උඩරටට පැමිණි කොන්ප්පු බණ්ඩාර, දොන් පිලිප්ගෙන් පසුව පළමුවන විමලධර්මසූරිය නමින් මහනුවර රජ විය.
2. දෙවන රාජසිංහ රජුට විරුද්ධව පැන නැගී නිල්ලඹේ කැරැල්ලට පෘතුගීසීන්ගේ සහාය ලැබිණි.
3. පෘතුගීසීන් පළවාහැරීම සඳහා උඩරට රජතුමා ලන්දේසීන් සමඟ 1638 දී ගිවිසුමකට එළඹිණි.
4. කීර්ති ශ්‍රී රාජසිංහ රජුට සියම් රටෙන් උපසම්පදාව ගෙන ඒම සඳහා ලන්දේසිහු සහාය ලබා දුන්හ.
5. උඩරට රාජ්‍ය සතුව පැවැති මුහුදුබඩ තීරයෙන් ගව්වක දුර ප්‍රමාණයක භූමි භාගයක් 1766 ගිවිසුමෙන් ලන්දේසීන්ට පැවරිණි. (.........)

25. ලංකා ජාතික සංගමය,

1. ලංකා ජාතික සංගමය 1919 දී පිහිටුවනු ලැබීය.
2. පොන්නම්බලම් අරුණාචලම් එහි ආරම්භක සභාපතිවරයා විය.
3. එස්. ජේ. වී. චෙල්වනායගම් ජාතික සංගමයෙන් ඉවත් වී ෆෙඩරල් පක්ෂය පිහිටුවිය.
4. ජාතික සංගමය, සිය කටයුතුවලදී ඉන්දියානු ජාතික සංගමයේ ආභාසය ලබා ගත්තේය.
5. ජාතික සංගමය විසින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා උද්ඝෝෂණ මෙහෙයවන ලදී. (.........)

අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා

(A) සහ (B) පමණක් නිවැරදි නම් ........................................................ 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ........................................................ 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ........................................................ 3 ද,
(A) සහ (D) පමණක් නිවැරදි නම් ........................................................ 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ...5 ද, තිත් ඉර මතලියන්න.

උපදෙස් සම්පිණ්ඩනය

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| (A) සහ (B) පමණක් නිවැරදි ය | (B) සහ (C) පමණක් නිවැරදි ය | (C) සහ (D) පමණක් නිවැරදි ය | (A) සහ (D) පමණක් නිවැරදි ය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද ?

(A) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය වසර 125,000 තරම් ඈත අවධියකට දිවෙන බව පිළිගැනේ.
(B) බලංගොඩ මානවයා හෝමෝසේපියන් වර්ගයට අයත් වේ.
(C) ඉබ්බන්කටුව, මූල ඓතිහාසික යුගයට අයත් සුසාන භූමියකි.
(D) සෙනරත් පරණවිතාන මහතා ශ්‍රී ලංකා ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පුරාවිද්‍යාත්මක ස්ථානවල කැණීම්වල නිරත වූයේය. (.........)

27. ශ්‍රී ලංකාවේ බුදු සසුනේ ඉතිහාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද ?

(A) දේවානම්පිය තිස්ස රජු මහමෙවුනා උයන සඟ සතු කොට පූජා කළේ ය.
(B) සිරිමේඝවණ්ණ රජු දවස දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී ලකාවට වැඩම කරවී ය.
(C) සංඝමිත්‍ර භික්ෂුව විසින් මහා විහාරය මහායානික මධ්‍යස්ථානයක් බවට පත් කරන ලදී.
(D) වළගම්බා රජු විසින් ජේතවනාරාමය ගොඩනංවන ලදී. (.........)

28. සීතාවක රාජ්‍ය සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද ?

(A) දෙවන පරාක්‍රමබාහු රජු පළමුවන ප රක්‍රමයාහ රජුගේ පුත්‍රයාය.
(B) මෙතුමා යාපහුව තම පාලන මධ්‍යස්ථානයක් බවට පත් කර ගත්තේය.
(C) කාලිංග මාඝ පරාජය කිරීම, මෙතුමා ලද වැදගත් දේශපාලන ජයග්‍රහණයකි.
(D) චන්ද්‍රභානුගේ ආක්‍රමණ සිදුවූයේ මෙතුමාගේ පාලන කාලයේදීය. (.........)

සීතාවක රාජ්‍ය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද ?
(A) 1521 දී සිදු වූ විජයබා කොල්ලයෙන් සීතාවක රාජ්‍යය ආරම්භ විය.
(B) විකිරි බණ්ඩාර කුමරු සීතාවක රාජ්‍යයේ ආරම්භක පාලකයා විය.
(C) මායාදුන් නේ රජුගේ අභාවයත් සමඟ සීතාවක රාජ්‍ය බිඳ වැටිණි.
(D) පළමුවන රාජසිංහ රජු විසින් 1582 දී උඩරට රාජ්‍යය සීතාවක රාජ්‍යය බිඳ වැටිණි. (.........)

30. බ්‍රිතාන්‍ය යුගයේ කෝපි වගාව සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද ?
(A) කෝපි අපනයනය ආරම්භ වූයේ මෙට්ලන්ඩ් ආණ්ඩුකාරයාගේ පාලන කාලයේදීය.
(B) ඉංග්‍රීසි පාලන සමයේ ප්‍රථම කෝපි වගාව ජෝර්ජ් බර්ඩ් විසින් ගම්පොළ සිංහපිටියේදී ආරම්භ කරන ලදී.
(C) කොල්බෲක්- කැමරන් ප්‍රතිසංස්කරණ හේතු කොටගෙන කෝපි වගාව ශීඝ්‍රයෙන් වර්ධනය විය.
(D) විසිවන සියවස ආරම්භ වන විටත් රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය කෝපි විය. (.........)

අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට පිළිතුර තෝරා ඊට අදාළ අංගය, තිත් ඉර මත ලියන්න.

31. ෆාහියන් භික්ෂුව මෙරටට පැමිණියේ කුමන රජුගේ පාලන සමයේ ද ?
1. මහානාම රජු 2. ධාතුසේන රජු 3. මහසෙන් රජු
4. පළමුවන මුගලන් රජු 5. බුද්ධදාස රජු (.........)

32. ගඩලාදෙණි සද්ධර්මතිලක විහාරය ඉදි කරන ලද්දේ කවර ශිල්පියා විසින්ද ?
1. ස්ථපතිරායර 2. ගණේශ්වරාචාර්ය 3. ශ්‍රී රාම චන්ද්‍ර භාරතී
4. දේවේන්ද්‍ර මූලාචාරී 5. තන්නූර් තුනෛයාර් (.........)

33. රන්දෙණිවෙල සටනේදී මියගිය පෘතුගීසි කපිතාන් ජෙනරල්වරයා කවුද ?
1. ජෙරනිමෝ ද අසවේද් 2. කෝන්ස්තන්තිනු ද සා ද නොරොඤා
3. පෙරේ ලෝපේස් ද සූසා 4. දියෝගි ද මොලෝ ද කස්ත්‍රෝ
5. ජෝර්ජ් ෆ්ලොරිම් ද අල්මේදා (.........)

34. නායක්කර් වංශයේ ආරම්භක පාලකයා කවුද ?
1. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු 2. රාජාධිරාජසිංහ රජු
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 4. ශ්‍රී විජය රාජසිංහ රජු
5. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (.........)

35. උපකෘත පාඨශාලා රජයට ගැනීමට සිදුවූයේ කවර ඇමතිගේ පාලන සමයේද?
1. එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා 2. ඩබ්ලිව් දහනායක මහතා
3. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 4. ඩඩ්ලි සේනානායක මහතා
5. ජේ. ආර්. ජයවර්ධන මහතා (.........)

අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලද'යි තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදිය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවන්න මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | ආරක්ෂාව පිණිස ලක්දිව තබා තිබූ පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ රැගෙන යාමට චෝල පාලක පළමුවන පරාන්තක රජු ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ විට හතරවන උදය රජු රුහුණට පළා ගියේය. | හමුදාවන්ට වැටුප් ගෙවා ගත නොහැකි වූ පස්වන මිහිඳු රජුට වරුද්ධව හමුදාව හා නගර වැසියන් කැරලි ගැසූ බැවින් ඔහු රුහුණට පළා ගියේ ය. | (.........) |
| 37. | පළමුවන පරාක්‍රමබාහු රජු පොළොන්නරුවේ අග රජු බවට පත් වීමෙන් පසුව දූදුරු ඔයේ ප්‍රධාන අමුණු තුනක් කරවී ය. | පළමුවන විජයබාහු රජු විසින් ශ්‍රී පාදස්ථානයට පූජා කරන ලද ගිලීමලේ ග්‍රාමය පසුකාලයේදී නිශ්ශංක මල්ල රජු විසින් නැවත පූජා කරන ලදී. | (.........) |
| 38. | හයවන පරාක්‍රමබාහු රජුගෙන් පසුව යාපනයේ සිට පැමිණි සපුමල් කුමරු එවකට බලයට පත්ව සිටි දෙවන ජයබාහු රජු මරවා හයවන බුවනෙකබාහු නමින් කෝට්ටේ සිහසුනට පත් විය. | පළමුවන විමලධර්මසූරිය රජුට පසු ඔහුගේ වැඩිමහල් පුත් මහා අස්ථාන කුමරු දෙවන රාජසිංහ නමින් කන්ද උඩරට රජු බවට පත් විය. | (.........) |
| 39. | ලන්දේසීන් ලංකාවේදී අනුගමනය කළ ආර්ථික ක්‍රියාමාර්ග උඩරට රාජ්‍යයේ ආර්ථිකය සංකෝචනය වීමට බලපෑවේ ය. | උඩරට රජු හා ලන්දේසීන් අතර හටගත් මතභේද හේතුකොට ගෙන රජු කඩවත් වසා දමූ අතර ඊට ප්‍රතික්‍රියා වශයෙන් .ලන්දේසීන් වරායයන් අවහිර කිරීම නිසා උඩරට ආර්ථිකයට වැදගත් වූ දකුණු ඉන්දියාව සමඟ කළ වෙළෙඳාමට බාධා ඇති විය. | (.........) |
| 40 | 1910 කෲ-මැකලම් ප්‍රතිසංස්කරණ මගින් ජනවාර්ගික නියෝජන ක්‍රමය අවලංගු කරන ලදී. | 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට කැබිනට් ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය. | (.........) |